www.xtrapapers.com

Cambridge O Level

**Cambridge International Examinations**
Cambridge Ordinary Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2017**

**1 hour 30 minutes**

INSERT

*6604665684-I*

**READ THESE INSTRUCTIONS FIRST**

This Insert contains the reading passage for use with the Question Paper.

You may annotate this Insert and use the blank spaces for planning.
This Insert is **not** assessed by the Examiner.

This document consists of **2** printed pages.

DC (ST) 137951/2
© UCLES 2017

CAMBRIDGE International Examinations

[Turn over

www.xtrapapers.com



Read the following passage carefully and then answer, briefly and in **Sinhala**, **Questions 3–12** on the Question Paper.

ගිම්හාන ඍතුවේ වැහි කුණාටු නිසා කාලගුණය අයහපත් විය. සතිය පුරා ගඟේ ජල මට්ටම ඉහළ නගින අයුරු ගැමියෝ බලා සිටියහ. ඊළඟ නගරයට යාමට තිබූ පාර තවමත් අවහිරයකින් තොරව පැවති හෙයින් ගමේ අයට බාධාවකින් තොරව ආහාර රැස්කර තබා ගැනීමට හැකිවිය. එසේ ම ඔවුන්ට අවශ්‍ය බෙහෙත් ද රැස්කර තබාගත හැකි විය. කාලගුණය ඉක්මණින් ම යහපත් වනු ඇතැයි ගැමියෝ විශ්වාස කළහ. කෙසේ වෙතත් සති අන්තයේ වැස්ස තව තවත් වැඩි විය. සෙනසුරාදා වන විට ජලය තම නිවෙස්වල දොරටු යටින් ගලා එන්නට පටන් ගෙන තිබූ බව ඔව්හු දුටුවෝය.

වාසනාවකට මෙන් සමහර ගැමියන්ට තිබූ කුඩා කාර්වලට තවමත් ගමේ පාර දිගේ නගරය දෙසට යාමට පුලුවන් විය. මේ නිසා ගමේ නායකයා මෙසේ නිවේදනයක් නිකුත් කළේය: ‘කරුණාකර කලබල නොවී ඉන්න. ඔබ සියලු දෙනා කුඩා කණ්ඩායම්වලට බෙදෙන්න. ඔබ අතරින් කීප දෙනෙක් පිටත ගොස් අපට මූලික වශයෙන් අවශ්‍ය දේවල් රැස් කරගෙන ඒම මට අවශ්‍යයි’, ඔහු කීවේය.

අවශ්‍ය බඩු මිල දී ගැනීමට ඊළඟ නගරයට යාම සඳහා ගමේ සමහරු සූදානම් වූහ. ඉරිදා උදෑසන ගැමියෝ සත් දෙනෙක් හා මලු රාශියක් රැගත් කාර් හතරක් නගරය දෙසට යාමට පිටත් වූහ. කාර් පිටත් වූ පසු ගැමි නායකයාට තවත් අදහසක් ඇතිවිය. වෙනත් ගැමියන් හතර දෙනෙකුට කතා කළ ඔහු බූරුවන් පිට නැගී එම කාර් පසු පස යන ලෙස ඔවුන්ට කීවේ නරක කාලගුණය නිසා තම ගමෙන් පිටත කෙබඳු හානි සිදු වී තිබේදැයි සොයා බැලීමටය. එවිට ඉතා ඉක්මණින් පවතින තත්වය ගැන ගැමි නායකයා දැනුවත් කිරීමට ඔවුන්ට හැකිවනු ඇත.

නගරයට ළඟා වීමට තව විනාඩි විස්සක දුර තිබිය දී කාර් නතර විය. විශාල ගසක් පාර හරහා වැටී තිබුණි. එහි බර කඳින් පාර අවහිර වී තිබිණ. පාර දෙපැත්තේ වූ ගල් සහිත අඩිපාරවලින් යාමට ද නොහැකිව තිබුණි. ගමට අවශ්‍ය දේවල් ගෙන එන්නේ කෙසේදැයි කාර්වල සිටි අය සිත් කරදර කර ගත්හ. බූරුවන් පිට ගමන් කළ අය ඒ මොහොතේ දී එහි ළඟා වූහ. පාරේ මේ කොටස තදින් මඩ වී තිබූ හෙයින් බූරුවන්ට ද එතැන නතර වන්නට සිදුවේයැයි කාර්වල සිටි ගමේ අය සිතූහ. කෙසේ වෙතත් බූරුවන් ඉතා ශක්තිමත් වූ හෙයින් උන්ගේ පිටේ ගමන් කළ මිනිස්සු පාර අයිනෙන් අඩිපාර දිගේ උන් ගමන් කරවීමට සමත් වූහ. කාර්වල සිටි අයට සැනසිල්ලක් ඇති වූයේ ඇද වැටී තිබූ ගස පසුකර නගරයට යාමට බූරුවන්ට හැකිවන බව පෙනී ගිය නිසාය. තමන් ගෙන ආ බඩු ලැයිස්තු බූරුවන් පිට ගමන් කළ අයට දුන් ඔව්හු, තමන්ගේ පශු සම්පත(සතුන්) රැක බලාගෙන සිටින තුරු ඔවුන්ට අවශ්‍ය මූලික දේවලින් හිඟයක් නොවන බව පෙනී ගිය හෙයින් ඇති වූ සුරක්ෂිත බව පිළිබඳ හැඟීමෙන් යුතුව කාර් හරවාගෙන ආපසු ගම දෙසට ගියහ.

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

To avoid the issue of disclosure of answer-related information to candidates, all copyright acknowledgements are reproduced online in the Cambridge International Examinations Copyright Acknowledgements Booklet. This is produced for each series of examinations and is freely available to download at www.cie.org.uk after the live examination series.

Cambridge International Examinations is part of the Cambridge Assessment Group. Cambridge Assessment is the brand name of University of Cambridge Local Examinations Syndicate (UCLES), which is itself a department of the University of Cambridge.